# උපාධි ප්‍රදානෝත්සවය
# CONVOCATION
# 2016

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
**University of the Visual and Performing Arts - Sri Lanka**
Bandaranaike Memorial International Conference Hall

# උපාධි ප්‍රදානෝත්සව දේශනය



**මහාචාර්ය සම්පත් අමරතුංග,**
**උපකුලපති,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

ගෞරවනීය ස්වාමින්වහන්සේගෙන් අවසරයි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ අභිනව කුලපති මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි මැතිතුමනි,

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ආරියරත්න කලුආරච්චි උපකුලපතිතුමා ඇතුළු මහාචාර්යවරුනි, ආචාර්යවරුනි,

ලේඛකාධිකාරීතුමා ඇතුළු පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීනි,

අද දින උපාධි ලැබූ උපාධිලාභීනි,

දෙමාපියනි,

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නවවන උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වීමට ඔබ සැමගෙන් අවසරයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් විධිමත් අධ්‍යාපනයක් ලැබීමට වරම් හිමිවන්නේ ඉතා සුළුතර සිසු දරුවන් පිරිසකට ය. එම සිසු දරුවන් සියලුම දෙනා ද නොයෙක් හේතු කාරණා නිසා උපාධිධරයන් වන්නේ නැත. සංකීර්ණ අපේක්ෂාවන්ගෙන් සැබැඳි වර්තමාන දැනුම පදනම් සමාජ සංස්ථාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබාගන්නා දිනය සැබැවින්ම ජීවිතයේ අමරණීය දිනයකි. ඒ අමරණීය දිනයේ දී ඔබ වෙනුවෙන් දේශනයක් පැවැත්වීමට අවස්ථාවක් ලැබීම මාගේ ජීවිතයේ ද අමරණීය සටහනකි. එනිසා, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නවවන උපාධි ප්‍රදානෝත්සවයේ දේශනය පැවැත්වීම සඳහා ආරාධනා කිරීම වෙනුවෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා ඇතුළු සනාතන සභා සාමාජිකයන්ට මාගේ ස්තුතිය හා ආචාරය පළමුව පුද කරමි.

දයාබර උපාධිලාභී මානව මානවිකාවනි, අදින් දශක කිහිපයකට පෙර ඔබ වන්වූ උපාධිලාභියෙකු වී අභිමානවත්ව උපාධිය ලබාගත් ඒ දිනය තවමත් මාගේ ජීවන ඉතිහාස පොතේ සදාතනික සිහිවටනයක්ව පවතී. එම සිහිනය සෑම වසරකම නැවත නැවතත් ආවර්ජනය වනුයේ ඔබවන් උපාධිලාභීන්ට උපාධි පිරිනමනා විශ්වවිද්‍යාලයේ අතිගාම්භීරයය වූ උපාධි ප්‍රදානෝත්සවයේ දී ය.

වසර විස්සකට ආසන්න කාලයක් අඛණ්ඩව වෙහෙස මහන්සිවී ලැබූ දැනුමෙහි අග්‍රඵලය, එනම් ,උපාධි සහතිකය, ඔබ අද ලබා ඇත. එය ප්‍රීතියක් ගෙනදෙන කරුණක් බව අවිවාදයෙන් පැවසිය හැකි ය. අද දිනය ඔබට පමණක් නොව ඔබගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් මෙන්ම ඥාති

හිතමිතුරන්ටද මහත් ප්‍රීතිමත් දිනයකි. එපමණක් ද නොව, පුරා දශක දෙකක් වෙහෙසවී ඔබ ලබාගත් ජයග්‍රහණය සමාජයේ අප සැමටමත් මහත් ප්‍රීතියක් ම වේ. නුදුරු අනාගත දිනයක සිට දුකින් පීඩිත මිනිසාගේ දුකට පිහිට වන්නට ඔබ දැන් පෙරටත් වඩා බොහෝ සවිමත් ය. ඔබගේ දැනුම සමාජය විසින් අද දින සිට තහවුරුකර ඇත්තේ ය. එනිසාවෙන් මුලු මහත් සමාජයම අද දිනයේ ප්‍රීතිමත් වන්නේ ය.

දයාබර උපාධිලාභී මානව මානවිකාවනි, පුරා දශක දෙකක් ඔබ අධ්‍යාපනය වෙනුවෙන් අඛණ්ඩ වෙහෙසක් ගත්තේ ඔබගේ සුන්දරම ළමා කාලයත් සුන්දරම නව යොවුන් වියත් කැපකරමිනි. ඔබ සමග මේ ගමනේ දී ඔබ ළඟින් සිටි බොහෝ මිතුරු මිතුරියන් සුන්දර ළමා කාලයේදීත් සුන්දර නව යොවුන් වියේදීත් අතීත මිතුරු මිතුරියන් සංසදයට එක්වූයේ වෙහෙසකරවූ මෙම ගමනේ දී ඔබ ඔවුන්ට වඩා අතිවිශිෂ්ටයන් වූ නිසා ය. ඔබ සිදුකළා වූ කැපවීම කොපමණද යත් ඉතා සීමිත පිරිසකට පමණක් හිමිවන රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලැබීමේ වාසනාව ඔබ ලබා ඇත්තේ ය. ඔබගේ උපාධි සහතිකයේ ලියැවී ඇති සෑම අකුරකම, සෑම වදනකම, සෑම අර්ථයකම සැබෑ හිමිකාරීත්වය ඔබ දැනුවත්ව හෝ ඔබ නොදැනුවත්ව ඔබටත්, ඔබගේ දෙමාපියන්ටත්, ඔබගේ සහෝදර සහෝදරියන්ටත්, ඔබගේ ඥාති හිතමිතුරන්ටත් හිමි වන අතර ඔබ නමින් වෙහෙස මහන්සි වූ තවත් එක් මානව කුලකයකට ද එහි හිමිකාරීත්වය හිමි බව ඔබ අවබෝධකරගත යුතුය. ඔබ නිදිවරා අකුරෙන් අකුරට, කවියෙන් කවියට, ගීතයෙන් ගීතයට විසංවාදයේ යෙදෙමින්, විවේචනාත්මක විමර්ශනයේ යෙදෙමින් දැනුම නමැති සාගරයේ කිමිදෙනා සෑමවිටකම දෑතේ කරගැට නැගෙමින්, අව් රශ්මියෙන් හිලිස්සෙමින්, දහඩියෙන් නැහැවෙමින් ඔබ නොහඳුනනා දස දහසක් මිනිසුන් ඔබගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් දරා ඇත. දුප්පත් මිනිසාගේ රුපියල් සතවලින් ඔබ නිදහස් අධ්‍යාපනයේ වරම් ලබා එහි අග්‍රඵලය වූ උපාධිය අද දින ලබා ඇත. දැන් ඔබ කුමක් කළ යුතුද යන්න ඔබ මෙන්ම ඔවුන්ද විමසනු ඇත. ඔබගේ හදවතින් විමසා සිටිය යුත්තේ ඔබ වෙනුවෙන් වියදම් දැරූ නොහඳුනනා මිනිසුන්ට යුතුකම ඉටුකරනුයේ කෙසේද යන්නය. සැබැවින්ම දුක්විඳි මිනිසාගේ දහඩිය සුවඳින් ඔබ ඔබේ හැකියාවට උපාධිය නම් වූ සමාජය ඉතා ඉහළින් පිළිගන්නා සහතිකය ලබා ඇත්තේ ය. අද දින ඔබ අත ඇති උපාධි සහතිකයේ වටිනාකම ඔබටත් සිතාගත නොහැකි තරම් වටිනා සහතිකයක් වනුයේ එබැවිනි. උපාධි සහතිකයෙන් ගම්‍යවන මිලකළ නොහැකි වටිනාකම මිල කිරීමට ඔබ කළගුණ දත් මිනිසෙකුව සමාජයේ දුක්විඳිනා මිනිසුන්ගේ දුකට පිහිටවිය යුතු ය.

ලෝකයේ සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් දෙස බැලීමේ දී මිනිසුන් මුදල් නමැති සාධකය භාවිතයෙන් සිය ජීවිත සුඛිත මුදිත කිරීමට උත්සාහ ගන්නා අයුරු දැකිය හැකි ය. නමුත් සැබෑව නම්, මුදලින් හෝ ධනයෙන් පමණක් සිය ජීවිත සුඛිත මුදිත කරගත් රටවල මිනිසුන් සැබැවින්ම ආධ්‍යාත්මික ගුණයෙන් පිරිපුන්ද යන්න අප හමුවේ මෙන්ම ඔවුන් හමුවේද ඇති ප්‍රශ්නාර්ථය වේ. තම වියදමින් නන්නාඳුනනා දරුවන්ගේ ඉගෙනුම වෙනුවෙන් වියදම් දරනා මිනිසුන් ජීවත්වන ලෝකයේ ඇති එකම රට අපේ රට බව මහත් ආඩම්බරයෙන් කිව හැකි ය. එය අපේ අධ්‍යාපනයේ සැබෑ පදනම ම වේ. ඒ අධ්‍යාපනයේ පදනම තුළින් ගොඩනැගී ඇති සමස්ත සමාජ පද්ධතිය තම දරුවාට ඇති සෙනෙහසම අන් දරුවාට ලබාදීමට තරම් පොහොසත්වී ඇත්තේ ය. ඒ නිසා අද දින සිට දූයේ වෙසෙනා සෑම තරාතිරමකම දරුවන් ,අපේ දරුවන්, ලෙසින් සිතන්නට ඔබට හැකිවිය යුතු ය. අපේ රටේ ඉන්නා සෑම දරුවෙකුටම තම දරුවන්ට සේ කතා කිරීමටත්, ආදරය කිරීමටත් රැකබලා ගැනීමටත්, ඔබට අයිතියක් පැවරී ඇති බව මැනවින් සිත් හි ධාරණයකරගත යුතුව ඇත.

තම දූ දරුවන්ට වියදම් කිරීමට නොහැකිවූ අනේක සංඛ්‍යාත දෙමාපියන් මෙන්ම තම අධ්‍යාපනයට වියදම් කිරීමට නොහැකිවූ අනේක සංඛ්‍යාත දෙමාපියන් ද සිය බදු මුදලින් තමා නොදන්නා දූයේ දූ දරුවන්ව දැනුමෙන් පෝෂණය කරනු ලබන අපූර්වතම සැබෑදියාව අත්විඳින්නට අතීතයේ දී අපටද වර්තමානයේ දී ඔබට ද අනාගතයේ දී ඔබේ දූ දරුවන්ටද හැකියාව ඇත්තේ මේ සුන්දර ශ්‍රී ලංකාවේ දි පමණි. කන්නන්ගර දර්ශනයෙන් නිදහස් අධ්‍යාපනය ලබාගත් ඔබ දූයේ දුක්විඳිනා මිනිසුන්ගේ දුක්ඛදෝමනස්සයන් හමුවේ කුඩා හෝ වදනකින් ඔවුන් සුවපත් කිරීම පරම යුතුකම කරගත් ආදර්ශමවත් ජීවිතයක් හිමිකරගත යුතු ය. කිසිදා මේ සුන්දර මිනිසුන් ජීවත්වන සුන්දර රට අමතක නොකරන ලෙසට ඉතා දයාබරව ඔබෙන් ඉල්ලා සිටීමට මටත් මේ සභාවේ සිටිනා කුලපතිතුමා හා උපකුලපතිතුමා ඇතුළු සැමටත් අයිතියක් ඇත්තේ අප සැම නිදහස් අධ්‍යාපනයේ කන්නන්ගර දර්ශනයේ සුජාත දරුවන්වන නිසා ය. දේශ දේශාන්තර ජයගැනීම අපට මහත් කීර්තියක්වන නිසා විදේශ සේවානියුක්තිය අප කිසිවෙකුත් ප්‍රතික්ෂේප කරන්නේ නැත. අප සැම ඔබට කියා සිටිනුයේ ඔබ ලද අධ්‍යාපනයෙන් අනාගත දූයේ දරුවන්ගේ නැණැස පෝෂණය කිරීම සඳහා දූයට ආදරය කරනා ලෙසට පමණි. මේ රටේ අව්‍යාජ මිනිසාගේ ගතිගුණවලට, හැඟීම්වලට, කතාබහට, කනබොන දෙයට, ආදරය කරනා ලෙසට පමණි.

දයාබර උපාධිලාභී මානව මානවිකාවනි, නිදහස් අධ්‍යාපනය, නිදහස් අධ්‍යාපනයේ නොපෙණෙන මිනිසුන්, ඔවුන්ගේ පීඩිත ජීවිතය පිළිබඳ අපට කියාදෙන්නට එකල කිසිවෙකුත් නොසිටියේ ය. නමුත් අප ලද අධ්‍යාපනයෙනුත්, ජීවිත අත්දැකීම් සමුදායෙනුත් එය මැනවින් අවබෝධ කරගත්තෙමු. ඒ නිසාවෙන්ම අතීතයේ මෙන්ම වර්තමානයේත්, වර්තමානයේ මෙන්ම අනාගතයේත් අප උගත් යම් කරුණක්වේද, අප ලද යම්කිසි අත්දැකීමක්වේද, එය අනාගත දූයේ දරුවන්ගේ දියුණුව සඳහා ගුරු මුෂ්ටියකින් තොරව ලබාදෙන්නට අපට හැකි ය. අප ජීවත් වනුයේ එවන් උදාර වූ පරමාර්ථ සමුදායක් සමගිනි. එවන් උදාර පරමාර්ථයකට අප හා ඒකාත්මික වන්නට ඔබ සැමට ආරාධනා කරනුයේ අපේ සෙනෙහස හා අපේ යුතුකම බලාපොරොත්තුවෙන් සිටිනා දූසේ අසරණ දරුවන් බොහෝ පිරිසක් තවමත් අප සමාජයේ ජීවත්වන නිසාවෙනි.

සමාජ අසාධාරණය හමුවේත්, ස්වභාව ධර්මයේ නියමය හමුවේත් අසරණ වන මිනිසුන්ට පිහිටක් වන මිනිසකුවේද ඔහු හෝ ඇය සැබෑ සුන්දර මිනිසෙකි. එවන් මිනිසා සැබැවින්ම සෞන්දර්යේ සැබෑ අරුත විඳිනා මිනිසෙකි. සෞන්දර්යට ආදරය කරනා මිනිසෙකි. සෞන්දර්යෙන් තොර ජීවිතය අරුත් සුන් හිස් ජීවිතයකී. ලෝකයේ අරුත්බර ජීවිත ඇති මිනිසුන් හමුවේ අරුත්බර ජීවිත තනන්නට හැකි ලෝකයේ සැම මිනිසෙකුටම නොලැබෙන අමිල භාග්‍යය ඔබට හිමිවී ඇත. එය කෙතරම් භාග්‍ය සම්පන්නදැයි සිතා ගැනීමට නොහැකි තරම් ය. නමුත් ධනයෙන් දුප්පත් මිනිසුන්සේ ම රසාස්වාදයෙන් දුප්පත් මිනිසුන් අතිමහත් සංඛ්‍යාවක් අපේ රට තුළද ජීවත්වන බව දැසින් දකිනවිටත්, දෙසවනින් ඇසෙනවිටත් අපට ඇතිවනුයේ මහත් කම්පනයකි. සැබැවින්ම ඔවුන් සෞන්දර්ය කලාවේ ඇති සැබෑ රසය සැබැවින්ම විඳින්නේද යන්න අපට ඇත්තේ කුතුහලයකි. එය මහත් අපරාධයක් බව සිතෙනා අවස්ථා බොහෝ ය.

වර්තමානයේ නිර්මාණාත්මක සෞන්දර්ය යැයි කියාගන්නා බොහෝ නිර්මාණ අරුත් සුන් හිස් වදන්වලින් පමණක් සමන්විත නිර්මාණ වේ. පෙරදාට වඩා අද දිනයේ අරුත් සුන් නිර්මාණ අප තරුණ පරපුර අතර ප්‍රචලිත වී ඇතැයි මට සිතෙයි. ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන මෙන්ම තාක්‍ෂණය යන සැම ක්ෂේත්‍රයකම සියල්ල නිර්මාණයවී ඇත්තේ ස්වභාව ධර්මයාත් සෞන්දර්යයත් එකට එක්වූ නිර්මාණයක් ලෙසටයැයි මම සිතමි. හිස් අරුත් ඇති නිර්මාණවලින් පෝෂණය වුවහොත් අපේ ආර්ථිකයත්, සමාජීය හා සංස්කෘතික මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයන් අර්ථ ශුන්‍යවීමට ඇති ඉඩ හසර බොහෝ ය. දේශයේ රිද්මයට සෞන්දර්ය ක්ෂේත්‍රය මෙහෙයවීමේ නියම කළමනාකරුවෝ ඔබය. එහි නායකයෝ ද ඔබ ය. මෑත අතීතයේ අපේ ජාතියම හඬවා අප අතරින් වෙන්වූ ඔබේ සරසවියේ, එනම් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කුලපතිධුරන්දර ආචාර්ය පණ්ඩිත් අමරදේවයාණන්ගේ ලයාන්විත ස්වරයෙන් දේශීය ගීතයට සලකුණක් තනන්නට ගත් වෙහෙස අපමණ බව ඔබ අප මෙන්ම ලෝ වැසි බොහෝ දෙනා දන්නා කරුණකි.

*"ශාන්ත මේ රෑ යාමේ-කුමුදු මලේ සිරියා*
*සඳ කාන්ති වැදී සෞම්‍යා*

*එයි නැගී .... ප්‍රේම තරංගා*
*එයි නැගී හද ප්‍රේම තරංගා*
*මේ අමා දහරේ .... මේ අමා දහරේ....*

*නෙක තුරුලිය නැලවෙන්නේ*
*මේ සීතල මද පවනේ*

*හා ඇසේ වන කෝකිල ගීතේ*
*හා ඇසේ වන කෝකිල ගීතේ*
*සෝකයාවී සිඳිලා*
*වෙසඟ මේ පුන්පෝදා*
*නාහිමි දිනූ තෙලෙයිලෝනා*

*මේ රෑයේ ගීත ගයාලා*
*මේ රෑයේ ගීත ගයාලා*
*සුන්දර රඟ පාලා*
*අති සෝබන මේ උයනේ*
*අපි නැළවෙමු පෙම් දහරේ...."*

ගීතයේ සිධ

"බලා වැළපෙමි-නෙළාගනු බැරි
හන්තාන සිහිනේ...

දරා නෙත් අග-දොවා සිත් මල
ගොතනු මැන ලදුනේ .. සංසාර ගමනේ

වැහි පබළු යට-රඟමඬල මැද
ඔබේ දෑනේ-තුරුලු වෙන්නට

බිසෝ හැර ගිය-ළසෝ රඟහල
අමාවක අඳුරේ-නොයෙනු මැන ළඳුනේ

වඩින තුරු සඳ-දුරින් ඉන්නම්
තරු ඇඳුරු පෙම්-ගී අහන්නම්..

සෙඳුරු ඒ සඳ-දියේ එන්නම්
ඉඳිනු මැන-සොඳුරේ...
හන්තාන අරණේ..."

ගීතය දක්වා ඔහුගේ මුවින් පිටවූ ඒ ගීත දහරාව දේශයේ අනන්‍යතාවත්, සිංහල හුරුවත් අපේකමත් රකිමින් බාල, තරුණ, මහලු සැමගේ කලාකාමී හැඟීම් උද්දීපනය කරනු ලැබූ යුගයක් අපට හිමි විය. එම යුගයේම සිංහල ගීතය පෝෂණයෙහිලා අතිමහත් දායකත්වයක් දුන් මහා ගාන්ධර්වයෙකු ඔබේ කුලපතිධුරයට අභිනවයෙන් පත්වීම අපට මහත් සතුටකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පළමු වසර නවක සරසවි සිසුවෙකුවූ මට, 1983 වර්ෂයේ එක්තරා සොඳුරු රාත්‍රියක දී විශ්වවිද්‍යාලයේ ඓතිහාසික බණ්ඩාරනායක ශාලාවේ වේදිකා මස්තකයේ සිට, එක් තරුණ ගායකයෙකු

"ඇවිලුනු ගිනිදැල් නිවී නිවී යද්දී-ඈ මට හමුවුවා
සුපිපුණු වනමල් සුවඳ හමද්දී-ඈ මට හමුවුවා

රන් කෙඳි දහරින් පෙරි පෙරි ඉහිරී..
රන් කෙඳි දහරින් පෙරි පෙරි ඉහිරී..
හිරු අවරට ඇදුනා..
පාලුව තනිකම රජයන විටදී...
පාලුව තනිකම රජයන විටදී...
ඈ මට හමුවුවා...

සුසිනිදු සැළුවක් සුළඟට ඇඹරී...
සුසිනිදු සැළුවක් සුළඟට ඇඹරී...
රහසක් මට කීවා
සුදු මුදු වැල්ලේ සිටියදී තනිවී...
සුදු මුදු වැල්ලේ සිටියදී තනිවී...
ඈ මට හමුවුවා..."

යන මිහිරි ගීය ගයනු හොඳින් මතකයේ ඇත.

ඒ ගීතය ගැයූ තරුණ ගායකයාණන් අද මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි නම් වූ ඔබේ කුලපතිවී ඇත. එදා ඔබ ගැයූ ඒ සොඳුරු ගීතය වසර තිස් තුනකට පසුත් අදත් මසිතෙහි මැවෙන්නේ මා ගත කළ පළමුවැනි වසර සරසවි මානවකයෙකුගේ සොඳුරු ජීවිතය නැවත මෙනෙහි කරමිනි. සිංහල ගීතයත්, කවියත්, නර්තනයත්, වාදනයත්, සිංහල වංශය ලියන්නට දුන් දායකත්වය අතිමහත් යුගයක අරුත් සුන් වූ මනෝ චින්තනයන් සමාජගත කරන වර්තමාන කලාකරුවන් දෙස අප බලා සිටිනුයේ මහත් කලකිරීමකිනි. සිංහල සාහිත්‍යයේ අසම්මත ගමන වළකාලමින් නව පර්යේෂණ තුළින් සිංහල සාහිත්‍යයේ නව මාවත් ජනිත කරමින් සිංහල ගීතය, සිංහල කවිය, සිංහල නර්තනය, සිංහල වාදනය, සිංහල නවකතාව ගෝලීය සමාජයේ සැම මිනිසෙකුගේම සෞන්දර්යාත්මක වින්දනයට හසුකරලීමේ මහා කාර්යභාරයය ජවයෙන් පිරි ඔබේ

වගකීමක් බවට පත්ව ඇත්තේ ඔබ එහි නිපුණයන් වන නිසාවෙනි. එය ඔබ මැනවින් ඉටු[illegible] අකුරු ඉගැන්වූ සියලු ගුරුවරුන්ගේ අභිලාෂය ඉටුකරනු ඇතැයි මම සිතමි.

සැබෑ ගුරුවරයා තම ගෝලයන් තමා පසුකර ඉදිරියට යනෙනා ගමනේ දී ආධ්‍යාත්මික වූ ප්‍රීතියක් ලබන්නාවූ අපූර්ව වූ සමාජ චරිතයකි. ගුරුවරයා අඳුරෙහි වූ ඔබට ආලෝකය ලබාදුන්නේය. ඔබ ආලෝකයෙන් පුරවාලන්නට ගුරුවරයා ගුරුමුෂ්ටියකින් තොර ආදර්ශමත් චරිතයක් වූ නිසා දෙමාපියන්ටත් වඩා ඔබගේ ගෞරවය හිමිවන්නේ ගුරුවරුන්ට ය. එවන් ගුරුවරුන් වන්දනා කිරීම ජීවිත ගමනේ ඔබ මුහුණ දෙන්නා වූ අනන්ත අප්‍රමාණ හිංසා පීඩාවන්ගෙන් ඔබට රැකවරණය ලබාදෙන්නට අදෘශ්‍යමාන බලයක් ජනිත කරන්නේ ය. අදින් පසු ඔබ අතරින් කිහිපදෙනෙකු හෝ ගුරුවරයෙකුව දූයේ දහසක් වූ දූ දරුවන්ගේ නැණැස පාදනු ඇත. දිනෙක ඔබේ දරුවන්ට ඔබේ ලේ කිරිකර පොවනා දිනයක දී දූයේ දරුවන්ට සිප් කිරි බෙදා දෙන්නට ඔබට හැකිවිය යුතු ය. ලේ කිරට අඩමින් ඔබේ ඇකයේ සුරතල්වන ඔබේ දරුවාට ඇති අසීමිත වූ දරු සෙනෙහස දූයේ දරුවන්ටත් ලබාදෙන්නට අපේ අම්මාවරුන්ට හැකිනම් අපේ රට කොපමණ ලස්සන වෙන්නට හැකිදූයි මට සිතේ. දරු සෙනෙහස දෙමාපියන්ගෙන් වෙන්කර ලන්නට කිසිවෙකුටත් නොහැක්කකි. බලු කුඩුවක දමා දවස් ගණන් හිරකර සිටි දයාබර පියාගේ මුවින් පිටවනුයේත්, මහමග අතරමංකර දමා ගිය දයාබර මෑණියන්ගේ මුවින් පිටවනුයේත්, මහලු නිවසේ දමා ගිය මවගේත් පියාගේත් මුවින් පිටවනුයේත් එකම හඩකි. එකම පැතුමකි. දෛවයේ සරදමට නැතහොත් සංසාරේ ගෙනඑන කර්මයට සිය අසරණකම ගළපා සමාජයෙන් ඇතිවන අපවාදවලින් තම දූදරුවන්ව මුදවන්නට තරම් මේ දෙමාපියන් පරාර්ථකාමී වනුයේ දරුවන්ට ඇති සෙනෙහස ඇට මිදුලු දක්වාම දිවගිය නිසා නොවේදූයි අපට සිතෙයි.

ඔබගේ ජයග්‍රහණ රැඳී ඇත්තේ ඔබට ලැබෙන්නාවූ ආශිර්වාද තුළිනි. එවන් ආශිර්වාද අතර දෙමාපියන්ගේ දාරක ප්‍රේමයෙන් නැගෙනා ආශිර්වාදය වෙනත් ආශිර්වාදයකට සමකළ නොහැකි ය. දෙමාපියන් අද වියපත්වී ඇත්තේ ඔබට තාරුණ්‍ය ලබාදීම නිසා ය. ඔබත් දිනෙක මවක හෝ පියෙකු වනු ඇත. ඔබත් දිනෙක ඔබේ දරුවන්ට තාරුණ්‍යය දී මහලුවියට පත්වනු ඇත. එදිනට දාරක ප්‍රේමයේ අරුත ඔබත් අවබෝධකරගනු ඇත. ඔබ මෙතෙනට ඔසවා තැබූ ඔබේ දෙමාපියන්ට නිසි ගෞරවය, නිසි ආදරය, නිසි රැකවරණය ලබාදීමට ඔබට නොහැකිනම්, සැබැවින්ම ඔබ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා නොගත්තා වැනි ය. එය ඔබේ විශ්වවිද්‍යාලයටත්, ඔබේම ගුරුවරුන්ටත් ඔබ නිගාදෙවන කරුණකි. ඔබගේ ජීවිත කාලයේ ඔබ කළාවූ බොහෝ දේ වෙනුවෙන් ඔබේ දෙමාපියන් කොතරම් දුක්වන්නට ඇද්ද? ඔබ කළාවූ බොහෝ දේ වෙනුවෙන් ඔබේ දෙමාපියන් අනුන්ගෙන් අපවාද ලබන්නට ඇද්ද? මේ සියල්ල සිය ලය ඔඩලේ සඟවා තබන්නට තරම් උතුම් වූ දෙමාපියන්ව අසරණවූ මොහොතක අමතකකර දැමිය හැකිවේ නම්, ලෝකයාගේ අපවාද නොව ඔබේ හෘද සාක්ෂියට අවනතව මිය යන්නට දිනෙක ඔබට නොහැකිවනු ඇත.

සැබෑ සෞන්දර්යවාදියෙකු ගුරු දෙගුරු නැමදීම සදාතනික දහමක් ලෙස සිතා සෑම දිනයකම වන්දනා මාන කරනු අප දක ඇත. එවන් සැබෑ සෞන්දර්යවාදියෙකුව ජීවත්වන්නට අවැසි ශක්තිය හා ධෛර්යය පසුගිය කාලය පුරා විවිධ පැතිකඩ ඔස්සේ ඔබ විසින් ලබාගන්නට ඇතැයි විශ්වාස කරමි. ඉතින් ඔබ සාර්ථක සමාජීය මිනිසෙකු වීමටනම්, සමාජ සංස්ථාවට බරක් නොවන, සමාජ සංස්ථාවේ වර්ධනයට දායකවන සමාජීය මිනිසෙකු විය යුතු ය. ඔබ සමාජ සංස්ථාවේ සැබෑ සාමාජිකයෙකු වීමට නම්, ඔබගේ වෘත්තීය මාර්ගය මැනවින් නිර්වචනය කර තිබිය යුතු ය. අතීතයේ සිටම මිනිසුන්ගේ ආකල්පයක් වූයේ සෞන්දර්ය ක්ෂේත්‍රය යනු හුදෙක් මිනිසුන්ගේ රසාස්වාදය ජනිතකරනු ලබන ආදායම් ඉපයීම අතින් ඉතා පහළ මට්ටමක පවතින ක්ෂේත්‍රයක් ලෙසට ය. කුමන ක්ෂේත්‍රයක වුවද මිනිසාට ආදායම් ඉපයීමේ සීමාවක් ඇති බව අප සෑම හොඳින් දැනගත යුතු කරුණකි. එය සොබා දහමේ නීතියකි. එම නීතිය උල්ලංඝනය කරන්නෝ බොහෝ කෙටි කාලයකින් සමාජයෙන් අගෞරවය ලබා ජීවිත රඟමඩලෙන් බැසයන්නෝ ය.

සෞන්දර්යවාදීන් වන ඔබ හුදෙක් සිය ජීවන වෘත්තියේ දී අපේකම, අපේ හැදියාව, අපේ වටිනාකම, අපේ විශ්වාසය, අපේ ධර්මතාව මෙන්ම අපේ වීරකතාව තුළින් විද්‍යමාන හරය උද්දීපනය කිරීමටත්, සමාජයේ අසාධාරණය, අයුක්තිය වෙනුවෙන් සටන් කිරීමටත්, සමාජ ශෝධකයෙකුගේ භූමිකාවත් සිදු කළ යුතුවනුයේ සම්ප්‍රදායත් නව්‍යතාවත් දේශයට හුරු බසත්, දේශයට හුරු රීතියත් එකට සංකලනය කිරීමෙනි. එවිට ඔබ සැබැවින්ම දේශයට හිතැති ව්‍යවසායකයෙකු වනු ඇත. ව්‍යාපාරික මානයෙන් මිදී ව්‍යවසායකයෙකු වන්නට ඔබට අනන්ත වූ අවස්ථා ඔබේ ක්ෂේත්‍රයේ පවතී. නමුත් වර්තමානයේ අපට දැකිය හැකිවනුයේ දේශීය හුරුවේ ඇති හරය පසෙක තබා දේශයට හුරු නැති අරුත්සුන් නිර්මාණකරණයේ යෙදීමෙන් කලා ක්ෂේත්‍රය විකෘති තත්ත්වයකට පත්වී ඇති බව ය. ව්‍යවසායකත්වය යනු කුමක් ද? ව්‍යවසායකයෙකු යනු කවරෙකු ද? ඉතා සරල උදාහරණයකින් මම එය පැහැදිලි කිරීමට කැමැත්තෙමි. ඇසුරුම්කරණය සම්බන්ධයෙන් ලෝකයේ පළමුවැනි ස්ථානය හිමිකරගත් ව්‍යවසායකයෙකු මෑතකදී මට හමුවී ය. ඔහුගේ ඇසුරුම්කරණය ලෝකයේ ආරක්ෂිතම

ඇසුරුම්කරණය ලෙසට ලෝකයම පිළිගත්තේ ය. අඩි පනහක් හැටක් උස පොල් ගසකින් පොල් ගෙඩි බිමට වැටෙනාවිට පොල්ගෙඩියේ පොල් කට්ටට හානියක් නොවන බව ඔබ අදවන තුරු නොසිතන්නට ඇත. මෙම ව්‍යවසායකයාගේ දැක්ම දිවගියේ දෛනිකව ඔබ අප දකිනා සරල සිද්ධියක ඇති ගැඹුර දැකීමට ය. පොල් ගෙඩියක පොල් කට්ට නොබිඳෙන්නට හේතුව පොල් කොහු සහ පොල් ලෙල්ල වේ. මේ සොබා දහමේ අසිරිය තවකෙකුට කලින් දැකීමට හැකිවූ ඒ ව්‍යවසායකයා ට පොල් ලෙල්ලේ කොටස් භාවිත කරමින් ලෝකයේ ආරක්ෂිතම ඇසුරුම්කරණය සකසා ලෝකයේ හොඳම ඇසුරුම්කරණයට හිමි සම්මානය දිනන්ට හැකිවි ය. ඔහු අනෙක් ව්‍යාපාරිකයන්ට වඩා වෙනස්වූ නිසාවෙන් අලුත් සිතුවිලි දහරාවකින් අලුත් දෙයක් තැනුවාසේ ඔබගේ ක්ෂේත්‍රයේ අලුත් දේ තනන්නට ඔබගේ සිතුවිලි දහරාව නිර්මාණශීලීව යොදවන්නට ඔබට හැකිවිය යුතු ය. ඔබ ව්‍යවසායකත්ව දක්ෂතාව පුරුදු පුහුණු කරන්නේ නම්, දිනෙක දේශයේ ජන හදවත්වල සදාතනිකව ජීවත්වීමට හැකිවනවා මෙන්ම විදේශයේත් මිනිස් සිත් සතන් ඇද බැඳ ගැනීමට ඔබට හැකිවනු ඇත.

අලුත් දේ සිතන්නට ඔබට නොහැකියැයි ඔබ කිසිදා නොසිතන්න. පළමුවැනි අඩියර මෙන්ම දෙවන තෙවන අඩියරයන් ද ඔබ අසමත්වනු ඇත. අසාර්ථක මිනිසාට බැණවදිනා සංස්කෘතියක අසාර්ථකවීම ඔබ ධනාත්මකව භාවිත කරන්නේනම්, බැණවැදීම්, විවේචන, ඔස්සේ දිනෙක කිසිවෙකුටත් සිතාගත නොහැකි නිර්මාණයක හිමිකරුවෙකු වන්නට ඔබට හැකියාව ඇත. තෝමස් අල්වා එඩිසන් විසින් දහස් වතාවක් විදුලි බල්බය තැනීමට පර්යේෂණවල යෙදුණේ ය. නවසිය අනූ නව වතාවක් ඔහු අසාර්ථක මිනිසෙක් විය. දහස්වන අවස්ථාවේ ඔහු සාර්ථක මිනිසෙක් විය. අපට විදුලි බල්බයක් ලබාදීමට ඔහු නවසිය අනූ නව වතාවක් අසාර්ථක මිනිසෙකු විය. ලෝකයේ සෑම ඉංජිනේරුවෙකුම දන්නේ විදුලි බල්බයක් සෑදීමේ එක් ක්‍රමයක් පමණි. ඔවුන් කිසිවෙකුත් විදුලි බල්බයක් තැනීමේ අසාර්ථක ක්‍රම කිසිවක් නොදන්නේ ය. නමුත් විදුලි බල්බයක් සෑදිය නොහැකි ක්‍රම නවසිය අනූ නවයක් දන්නා ලෝකයේ සිටි එකම පුද්ගලයා තෝමස් අල්වා එඩිසන් පමණි. ඒ ඔහු අසාර්ථකත්වයෙන් ලද දැනුම නිසා ය. ලෝකයේ බොහෝ රටවල මිනිසුන් නව්‍යකරණයේ දී අසමත්වන අවස්ථාවල ගල්-මුල් වෙනුවට තුති-මල් පිළිගන්වනු ලැබුවත් අපේ රටේ එවැනි සාම්ප්‍රදායක් දැකීමට නොහැකි ය. අපට ඇත්තේ ගල්-මුල් වලින් අසාර්ථකත්වය මැනීමේ සාම්ප්‍රදායකි. ගල්-මුල් තුති-මලක් යැයි සිතන්නට ඔබට පෞරුෂත්වයක් ඇතිනම්, සැබැවින්ම ඔබ දිනෙක දේශ දේශාන්තරයේ ලාංකික නම සදාතනිකව සටහන් කරනු ලබන සැබෑ සෞන්දර්යවාදී කලාකරුවෙකු වනවා නොඅනුමාන ය.

දයාබර උපාධිලාභි මානව මානවිකාවනි, සෞන්දර්යවාදී කලාකරුවන් ලෙස ඔබ සමාජයට මුසුවන වර්තමාන යුගයේ අපට ඇති අභියෝග බොහෝ ය. සදාචාරය වෙනුවට වෛරය සහ ක්‍රෝධය වපුරනා ව්‍යාපාරික ප්‍රජාවත් අසම්මතවූ සෞන්දර්යවාදී චින්තනයත් නිසා සමාජය අපගමනයක යෙදෙමින් පවතින්නේයැයි සිතමි. මිනිසුන්ට ආදරය කළ යුතු කාලය මිනිසුන් විනිශ්චය කිරීමට මිනිසා යොමුවීම දුකට හේතුවකි. එක් මිනිසෙකුගේ කුස ගින්න නිවන්නේ නැතුව දහසක් මිනිසුන්ගේ කුසගිනි නිවනා මග සොයන්නට එකිනෙකා ඇන කොටා ගන්නා යුගයක් නිර්මාණයවී ඇත. මේ අභියෝග හමුවේ සුභාවිත සෞන්දර්යවාදියෙකු වන්නට ඔබට ගුරුකොට ගත හැකි ඔවදන් බොහෝ ඇත. මහත්මා ගාන්ධිතුමා වරක දැක්වූ පරිදි අභියෝග හමුවේ නොසැලෙන මිනිසෙකු වන්නට ඔබට අවශ්‍ය වනුයේ භෞතික ශක්තිය නොව ස්ථිර අධිෂ්ඨානය පමණකි. ඔබ දැකිමට කැමති ලෝකය වෙනස් කිරීමේ හැකියාව ඇත්තේ ඔබ තුළ බව එතුමා කිවේ මානව සදාචාරයේ භයානක පැතිකඩවල් කිහිපයක් පෙන්වා දෙමිනි. ඔබ අද දින සිට සඵලදායි ක්‍රියාවකින් තොර ධනවතෙකු නොවීමටත්, චරිතයෙන් තොර දැනුමැති පුද්ගලයකු නොවීමටත්, සදාචාරයෙන් තොර ව්‍යාපාරිකයෙකු නොවීමටත්, මානුෂිකත්වයෙන් තොර විද්‍යාඥයෙකු නොවීමටත්, මූලධර්මවලින් තොර දේශපාලඥයකු නොවීමටත් වගබලාගත යුතු ය. එවිට තෙරේසා මව්තුමිය කීවාමෙන් මිනිසුන් විනිශ්චය නොකර මිනිසුන්ට ආදරය කරන්නටත්, දහසක් මිනිසුන්ගේ කුසගිනි නිවාලන්නට නොහැකිනම් එක් මිනිසෙකුගේ කුසගිනි නිවාලන්නට ඔබ සැමට හැකිවනු ඇත.

වික්ටර් රත්නායකයන් සිය ගීතයකින් අපට කියා දෙනු ලබන මා හැඟි පණිවුඩයක් ඔබ හමුවේ තබා ඔබෙන් සමුගැනීමට මම අවසර පතමි.

"ළිඳෙන් වතුර බීලා-එයින් වතුර නාලා
ළිඳට ගල් ගසාලා-වතුර බොර කරයි මිනිසා
වතුර බොර කරයි
ගඟට ආවඩයි

ගහේ වැල එතීලා-යාවි හැදී
පසුව පිළිලවීලා-සාරේ අදී..
කාල බීල නිදලා-කාලේ ගෙවයි
කාපු තැනද වනසා-මිනිසා දුවයි

ඉනිමං තබාලා-නැගීලා බලයි
එයට පහර දීලා-කඩාලා දමයි
අතීතේ නසාලා-දිනුවා සිතයි
තැබූ තැනද නැතිවී-පරාජය වැටෙයි"

ඔබ වික්ටර් රත්නායකයන් කියූ පරිදි ජලය බොර කරන්නට ළිඳට ගල්ගසා, ගඟට ආවඩනා විද්‍යාර්ථියෙකු නොවනු ඇතැයි මම සිතමි. දිනෙක ඔබ සිතනා ලෝකය ඔබ විසින්ම නිමවා සූවාසූ දහසක් දුක්විඳිනා මිනිසුන්ගේ සිත් සතන් සුවපත් කිරීමට අදින් එළඹෙන ඔබේ ජීවිතයට ශක්තිය ධෛර්යය මෙන්ම අධිෂ්ඨානය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඩ වෙමි.

ඔබ සැමට ස්තූතියි.